# මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
# நிதி மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
# MINISTRY OF FINANCE AND ECONOMIC AFFAIRS

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.11.27

**ප්‍රවෘත්ති නිවේදනයයි**

**ඩොලර් පිටකිරීමට මුදල් ඇමැති නීතිවිරෝධීව රේගුවට බලපෑම් කළැයි යන පුවත මුදල් අමාත්‍යාංශය ප්‍රතික්ෂේප කරයි**

නීතිවිරෝධීව ඩොලර් රටින් පිටකිරීමට තැත්කළ පුද්ගලයා නිදහස් කරන්නැයි මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ශ්‍රී ලංකා රේගුවට බලපෑම් යනුවෙන් වෙබ් අඩවි සහ සමාජ මධ්‍යවල පළ වූ ප්‍රවෘත්තිය පිළිබඳව මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබේ.

ශ්‍රී ලංකාවෙන් බැහැරට යන විදේශිකයකු සතුව තිබී ඇ.ඩො 53,455ක මුදලක් ශ්‍රී ලංකා රේගු නිලධාරීන් විසින් කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ මෑතකදී අත්අඩංගුවට ගෙන තිබිණි.

ඉරාන සමූහාණ්ඩු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියේ සේවය කරන විදේශ සේවකයන් විසින් තම මාසික වැටුප මෙසේ රටින් බැහැරව යැවීමට කටයුතු කළ අවස්ථාවේදී කටුනායක ගුවන්තොටුපොළේ රේගුව විසින් මෙම වැටලීම කර ඇති බව වාර්තා විය.

විදේශිකයන් තම වැටුප් මුදල මෙසේ යැවීම පිළිබඳ සානුකම්පිතව සළකා බලා මුදල් නිදහස් කරන්නැයි 2018 ඔක්තෝබර් මස 03 දින ශ්‍රී ලංකාවේ සිටින ඉරාන තානාපතිතුමා විසින් මුදල් අමාත්‍යතුමාට ඉල්ලීමක් කර තිබිණි.

ඒ අනුව ශ්‍රී ලංකා රේගු ආඥාපනතේ 164 වැනි වගන්තිය අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව තානාපති මාර්ගයෙන් කරන ලද ඉල්ලීම පිළිබඳ සානුකම්පිතව සලකා බලා අදාළ ඇ.ඩො 53,455ක මුදල අදාළ පුද්ගලයා වෙත ආපසු භාර දෙන මෙන් මුදල් හා

ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ශ්‍රී ලංකා රේගුව වෙත නියෝග කරන ලදී.

ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශිකයන් විසින් මේ අයුරින් මුදල් රැගෙන ගිය ප්‍රථම අවස්ථාව මෙය නොවේ. මෙයට පෙර මේ අයුරින් විදේශ මුදල් රටින් රැගෙන ගිය අවස්ථාවේ දී විදේශිකයකු කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ දී අල්ලා ගත් විටද එවකට සිටි මුදල් අමාත්‍යවරයා විසින් ද 2018 ජූනි මස  මේ අයුරින් එම මුදල් සානුකම්පිත පදනම මත නිදහස් කරන ලදී.

එම්.අලි හසන්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය